රිවිර

රිවිර මීඩියා කෝපරේෂන් (පෞද්ගලික)
සමාගම, අංක 7-1/2, කොටා රෝඩ්,
ආචාර්ය එන්.එම්.පෙරේරා මාවත,
බොරැල්ල, කොළඹ 08.

ප්‍රවෘත්ති අංශය - 0114330739
- 0114329717
- 0114329719
ප්‍රාදේශීය අංශය - 0114869969
ෆැක්ස් - 0114889021
e-mail - pnews@rivira.lk
provincialriviranews@gmail.com
බෙදාහැරීම් අංශය - 0114708831/32/33
Hot Line- 077 3451099
දැන්වීම් අංශය - 0114708831/32/33

මත මඩින අලුත් පොලිසිය

මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම මේ වන විට සමස්ත ලෝකයට ම හිසරදයක් වී ඇති අතර ඊට එරෙහිව ගත් ක්‍රියාමාර්ග බොහොමයක් අසාර්ථක වී තිබේ. ආසියාවේ හෙරොයින්, උතුරු ඇමරිකාවේ කොකේන්, උතුරු අප්‍රිකාවේ කංසා සහ යුරෝපීය කෘත්‍රිම මත්ද්‍රව්‍ය ලෝකයට ගලා එන දැවැන්ත මත්ද්‍රව්‍ය ප්‍රවාහය නවතාලීමට කිසිවකු සමත් වී නොමැත. මේ නිසා වසරින් වසර මත්ද්‍රව්‍ය උවදුර දරුණු වසංගතයක් බවට පත් වෙමින් තිබේ. දැන් වසරකට ලොව පුරා මග පාරේ අලෙවි වන තහනම් මත්ද්‍රව්‍ය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන ලක්ෂ පහකි. මෙය බොහෝ රටවල වාර්ෂික දළ ජාතික නිෂ්පාදනයට වඩා ඉහළ අගයකි.

මේ පිටුපස සිටින ජාවාරම්කාරයන්ට එරෙහිව කටයුතු කළ හැකි ආකාරයට රටවල නීති පද්ධති සහ ආරක්ෂක අංශ බලාත්මක නොකිරීම නිසා ඔවුන්ට සියලු දෙනාගේ කනෙන් රිංගා යමින් සිය ජාවාරම් කරගෙන යාමට අවස්ථාව ලැබී තිබේ. ඇතැම් විට නීති තිබුණ ද විවිධ හේතු නිසා නීතිය ක්‍රියාත්මක නොවෙයි. එලෙස නීති ක්‍රියාත්මක නොවන බොහෝ අවස්ථාවල අදාළ ජාවාරම පිටුපස ප්‍රබල දේශපාලන හස්තයක බලපෑම හඳුනා ගත හැකිය. නීතිය ක්‍රියාත්මක වුව ද ඒ ජාවාරම මුල සිටින හොරු මෝරුන්ට එරෙහිව නොව අග සිටින හාල්මැස්සන්ට එරෙහිවය.

මේ මත්ද්‍රව්‍ය ජාවාරමට ලොව පුරා ප්‍රචණ්ඩ ක්‍රියා, සංවිධානාත්මක අපරාධ මෙන්ම ත්‍රස්තවාදය සමග ද ඇත්තේ නොබිඳිය හැකි සබඳතාවකි. කළු සල්ලි ජාවාරම, ආයුධ හා මිනිස් ජාවාරම සහ දූෂණ සමග මත්ද්‍රව්‍ය ජාවාරම එකට ගැට ගැසී තිබේ. ඊට එරෙහිව පොලිස් සහ රේගු නිලධාරීන් පෙරට වඩා ප්‍රබල සටනක් දියත් කළ ද අවශ්‍ය භෞතික සහ මානව සම්පත් හිඟය ඊට බාධාවක් වී ඇත.

පසුගිය සමයේ අපේ රටෙන් දිගින් දිගට ම මත්ද්‍රව්‍ය තොග පිටින් අත්අඩංගුවට පත් වූ අතර ඒවායේ වටිනාකම රුපියල් කෝටි සිය ගණනකි. එහෙත් මේ මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ කිසිම ජාවාරම්කරුවකු අත් අඩංගුවට පත් වූයේ නැත. නැවතත් රුපියල් කෝටි ගණනක් වටිනා අයිතිකරුවකු නැති මත්ද්‍රව්‍ය තොගයක් පමණක් හමුවෙයි. ඒ පිළිබඳ සමාජයේ කතාබහ ද දින කිහිපයකට සීමා වන අතර මතකයෙන් මැකී යයි.

මෙලෙස අඛණ්ඩව මත්ද්‍රව්‍ය තොග අත්අඩංගුවට පත් වන්නේ රටට විශාල වශයෙන් මත්ද්‍රව්‍ය ඇතුළු වන නිසාය. එලෙස අත්අඩංගුවට පත් වුව ද කිසිදු අඩුවකින් තොරව ඔවුන්ට නැවත නැවත රටට මත්ද්‍රව්‍ය ගෙන ඒමට හැකි වී ඇත්තේ රටේ අලෙවි වන මත්ද්‍රව්‍ය ප්‍රමාණය සමග සසඳන විට එලෙස අත්අඩංගුවට පත්වන ප්‍රමාණය නොගිණිය හැකි තරම් කුඩා නිසාය.

එවැනි පසුබිමක මත්ද්‍රව්‍ය ජාවාරම් වැටලීම සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයකු යටතේ වෙනම පොලිස් ඒකකයක් පිහිටු වීමට නීතිය හා සාමය පිළිබඳ ඇමැතිවරයා කටයුතු කරන බව ප්‍රකාශ වීම යහපත් ප්‍රවණතාවකි. මත්ද්‍රව්‍ය ජාවාරම මැඩලීම සඳහා දැනට රටේ පවතින නීතිය ප්‍රමාණවත් නොවන්නේ නම් ඒ සඳහා වහා නව නීති සම්පාදනය කළ යුතු අතර පවතින නීති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියලු බලතල සහ සම්පත් අදාළ පොලිස් ඒකකය වෙත නො අඩුව ලබා දිය යුතුය. ඒ ඉතාම සංවිධානාත්මක ලෙස ක්‍රියාත්මක වන මත්ද්‍රව්‍ය ජාවාරම මැඩලිය හැක්කේ විශාල ධනස්කන්ධයක් වියදම් කර පවත්වා ගෙන යන එම සංවිධාන ජාලය බිඳලිය හැකි ප්‍රතිවිරෝධී බලවේගයක් බිහි කිරීමෙන් පමණක් නිසාය.

මත්ද්‍රව්‍ය ජාවාරම මැඩලීම ඔස්සේ මත්ද්‍රව්‍ය භාවිතය නිසා සමාජයේ ඔඩු දුවා ඇති බොහෝ අපරාධ පහත වැටෙනු ඇති අතර ඒ හා බැඳුණු සමාජ, සංස්කෘතික සහ සෞඛ්‍ය ප්‍රශ්න එකිනෙක විසඳෙනු ඇත. මත්ද්‍රව්‍ය භාවිතය නිසා ජනතාව රෝගාබාධවලට ගොදුරු වීමෙන් රජයට දැරීමට සිදුව ඇති විශාල ධනස්කන්ධයක් ඉතිරි කරගත හැකි වනු ඇත. එපමණක් නොව ඒ බැඳුණු සංවිධානාත්මක අපරාධ, ආයුධ ප්‍රවාහනය, ත්‍රස්තවාදය ආදිය ද මැඩලීමට අවශ්‍ය ජවය ලැබෙයි.

එහෙත් මෙලෙස මත්ද්‍රව්‍ය ජාවාරම මැඩලීම සඳහා විශේෂ පොලිස් ඒකකයක් ස්ථාපිත කළ ද එය දේශපාලන බලවතුන්ගේ බලපෑමට යට වන්නේ නම් එවැනි බලපෑම්වලින් තොරව නිදහසේ ක්‍රියාත්මක වීමට අවශ්‍ය සුපිරි බලයක් එහි ප්‍රධානීන්ට නොලැබෙන්නේ නම් ඒ ප්‍රධානීන් කිසිවකුට නොනැමී සිය රාජකාරිය දේවකාරිය කොට කටයුතු නොකරන්නේ නම් කොකේන්, හෙරොයින්, ගංජා, අබිං ආදී මත්ද්‍රව්‍ය වැටලීම සඳහා වෙන වෙනම පොලිස් ඒකක පිහිටු වුව ද ගඟට ඉනි කැපුවාට වඩා වැඩි දෙයක් වන්නේ නැති බව නම් නොකියාම බැරිය.

ඩ්‍රෝන තාක්ෂණය විධිමත් ලෙස රටේ සංවර්ධනයට යොදා ගත යුතුයි

කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයනායතනයේ
ආචාර්ය දමිත සඳරුවන්

මේ වන විට ශ්‍රී ලංකාවේ ඩ්‍රෝන හෙවත් සැහැල්ලු ගුවන් යානා භාවිතය වේගයෙන් ව්‍යාප්ත වෙමින් පවතියි. මෑත කාලයේ ඩ්‍රෝන භාවිතය නිසා ගැටලුකාරී තත්ත්වයන් මතු වූයේ වරක් දෙවරක් නොවේ. ඉදිරියේ දී ඩ්‍රෝන යානා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ලියාපදිංචිය අනිවාර්ය කිරීමට අවශ්‍ය නීති ප්‍රතිපාදන සකස් කරන බව හොබෝදා රජය ප්‍රකාශ කළේය. මේ ඩ්‍රෝන තාක්ෂණය, එහි ප්‍රතිලාභ, ඩ්‍රෝන අවභාවිතය සහ එය අවම කිරීමට ගතයුතු ක්‍රියා මාර්ග පිළිබඳ දෙස් විදෙස් අත්දැකීම් ඇසුරින් කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයනායතනයේ ආචාර්ය දමිත සඳරුවන් සමග රිවිර කළ සාකච්ඡාවකි.

ප්‍ර - ඩ්‍රෝන යානා කියන්නේ මොනවා ද?

පි - ඩ්‍රෝන යානයක් (Drone) මූලික වශයෙන් නියමුවන් රහිත ගුවන් යානයක් ලෙස හඳුන්වන්න පුළුවන්. මෙම යානාවල ඉතිහාසය ලෝක යුද සමයටත් වඩා ඈතට යනවා. එහෙත් මෑත කාලයේ කතා බහට ලක්වන ඩ්‍රෝන යානාවල ඉතිහාසය වසර 10වත් වැඩි නෑ. මේවා විවිධ තාක්ෂණික ක්‍රම මගින් දුරස්ථ පාලක මගින් සාමාන්‍යයෙන් පොළොවේ සිට අඩි 500 දක්වා ගුවන්ගත කරනවා. මෙම යාත්‍රාවල තාක්ෂණික හැකියා අනුව එහි මෙහෙයුම් සීමා වෙනස් වෙනවා. ඒවා ගෘහස්ථ පරිසරය, ඇසට පෙනෙන දුර හෝ ඇස් මානයෙන් ඔබ්බට යමින් නගර අතර ගමන් කිරීම දක්වා විහිදෙනවා.

ප්‍ර - ඩ්‍රෝන යානා කුමන කටයුතු සඳහා ද භාවිත කරන්නේ?

පි - ඩ්‍රෝන යානා හදිසි ආපදා අවස්ථාවල නිරීක්ෂණ කටයුතු, අත්‍යවශ්‍ය නිරීක්ෂණ සහ මෙවලම් සැපයීම, සම්බන්ධීකරණ කටයුතුවලට වගේ ම විපතට පත් පිරිස් බේරා ගැනීම සඳහා භාවිත කරනවා. ඒ වගේ ම නගර සැලසුම්කරණ සහ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රවල ඉදිකිරීම් පරිපාලන සහ නිරීක්ෂණ කටයුතුවලට වගේ ම අදාළ ප්‍රදේශවල භූ විද්‍යාත්මක සහ පුරාවිද්‍යාත්මක දත්ත රැස් කිරීම සඳහා මේ තාක්ෂණය යොදා ගන්නවා. ඒ වගේ ම ආරක්ෂක අංශ අපරාධ සිදුවන ස්ථාන නිරීක්ෂණයට, අපරාධකරුවන් හඹා යාමට, ආරක්ෂක නිලධාරීන් මෙහෙයවීමට සහ ආරක්ෂක අංශ නියමිත ලෙස ස්ථානගත කිරීමට ඩ්‍රෝන තාක්ෂණය භාවිත කරනවා. ඒ වගේ ම ජනමාධ්‍ය ආයතන සිය රූගත කිරීම්වලට වගේ ම චිත්‍රපට සහ විවිධ වැඩසටහන් නිෂ්පාදනයටත් මේ තාක්ෂණය යොදා ගන්නවා. මේ වන විට සමහර රටවල් ඩ්‍රෝන යානා ටැක්සි සේවා යොදා ගැනීමට අත්හදා බැලීම් කරගෙන යනවා.

ප්‍ර - ලංකාවේ ඩ්‍රෝන යානා භාවිත වන්නේ කුමන ක්ෂේත්‍රවල ද?

පි - දැනට ශ්‍රී ලංකාවේ මෙම තාක්ෂණය ජනමාධ්‍ය කටයුතු, චිත්‍රපට නිෂ්පාදන කටයුතු, කෘෂිකර්ම හා වාරි කටයුතු, ඩෙංගු වැනි රෝග මර්දන කටයුතු, විනෝදාස්වාදය සඳහා වගේම විවිධ නිරීක්ෂණ කටයුතු සඳහා බහුල ලෙස යොදා ගන්නවා.

ප්‍ර - ඩ්‍රෝන යානා තාක්ෂණයේ අනාගත බලපෑම කෙබඳු වේවි ද?

පි - මේ තාක්ෂණය වැඩි දියුණු කිරීමේ හා භාවිත පරාසයන් පුළුල් කිරීමේ පර්යේෂණ ලෝකයේ විවිධ විශ්වවිද්‍යාල මට්ටමින් සිදු වෙනවා. මේ අතරින් NASA සහ Stanford Intelligent Systems Laboratory ආයතන ඉදිරියෙන් ඉන්නවා. යානා අතර ඇති විය හැකි ගැටීම් හා යාන වෙනත් දෑ සමග ගැටීම අවම කර ගැනීමට ස්වයංක්‍රීයව තීරණ ගත හැකි යානා නිර්මාණය කිරීමේ පර්යේෂණ කටයුතු ඒ අතර විශේෂයි. ඒ පර්යේෂණ ප්‍රතිඵල අනුව ඉදිරි වර්ෂ 5 ඇතුළත මෙම යානා පහළ අහස් තලය පුරා ව්‍යාප්ත වෙයි. ඒ හා බැඳුණු ව්‍යාපාර ප්‍රමුඛ ඇති වෙයි. මේ වාතාවරණය යටතේ එදිනෙදා ජන ජීවිතයේ බොහෝ වෙනස්කම් සිදුවිය හැකියි. ඒ හා බැඳුණු නවතම උප සංස්කෘතියක් බිහිවිය හැකියි.

ප්‍ර - මේ නව තාක්ෂණික ප්‍රවණතා සඳහා අපේ රට සූදානම් විය යුත්තේ කෙසේද?

පි - නව තාක්ෂණය ඉක්මනින් ග්‍රහණය කර ගන්නා රටක් ලෙස ශ්‍රී ලංකාව මේ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතුයි. උදාහරණයක් විදිහට ශ්‍රී ලංකාවේ අද පවතින ත්‍රිරෝද රථ හා ටැක්සි සේවා තම සේවාදායකයන් හා ගනුදෙනු කරන ආකාරය බලන්න. මීට අවුරුදු 5කට කලින් ටැක්සියක් ලබා ගන්න mobile app භාවිත කිරීම ගැන කීවා නම් බොහෝ දෙනෙක් විශ්වාස කරන්නේ නෑ. නමුත් අද ලංකාවේ ඒ හා බැඳුණු උප සංස්කෘතියක් බිහිවෙලා.

ඒ අනුව ඉදිරි වසර කිහිපය තුළ විවිධ ආයතන සහ පුද්ගලයන් තමන්ගේ එදිනෙදා කටයුතුවලට ඩ්‍රෝන තාක්ෂණය යොදා ගන්න එකක් නෑ කියලා කාටවත් කියන්න බෑ. උදාහරණයක් විදිහට අනාගතයේ අපේ රටේ සුපිරි වෙළෙඳ සැල් වගේ ම ආපනශාලා තමන්ගේ භාණ්ඩ සහ ආහාරපාන පාරිභෝගික ජනතාව වෙත ප්‍රවාහනය සඳහා ඩ්‍රෝන තාක්ෂණය යොදා ගන්න පුළුවන්. ඒ නිසා මුල් අවධියේ සිට ම අදාළ නීති රෙගුලාසි සම්පාදනය කරමින් ඩ්‍රෝන යානා අවභාවිතය වැළැක්වීමට කටයුතු කිරීම වැදගත්. ඒ වගේම මේ හරහා ඇති වන ව්‍යාපාරික අවස්ථා පුළුල් කිරීමට සැලසුම් කළ යුතුයි. රාජ්‍ය හ රාජ්‍ය නොවන ආයතනවල කාර්යක්ෂමතාව හා ඵලදායීතාව නැංවීමටත් ඩ්‍රෝන තාක්ෂණය යොදා ගන්න පුළුවන්.

ප්‍ර - වර්තමාන ලෝකය තුළ ඩ්‍රෝන යානා අවභාවිතය පිළිබඳ සිදුවීම් විශාල වශයෙන් වාර්තා වෙනවා. ලොව පුරා ඩ්‍රෝන යානා භාවිත කොට සිදු කරන නීති විරෝධී කටයුතු මොනවා ද?

පි - විවිධ අපරාධවලට වුවමනා අවි ආයුධ සහ බෝම්බ ආදිය ප්‍රවාහනය සඳහා ඩ්‍රෝන යානා භාවිත කරනවා. ඒ වගේ ම ඩ්‍රෝන යානා භාවිතයෙන් අධිආරක්ෂිත කලාප වැනි පොදු ජනතාවට විවෘත නොවන ප්‍රදේශ ඡායාරූපගත කරනවා. යම් යම් පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වයට අභියෝග කරමින් ඔවුන්ගේ තොරතුරු රැස්කිරීමට ඡායාරූප ගැනීමට මේ තාක්ෂණය යොදා ගන්නවා. ඒ වගේ ම මත්ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා ඇති ආරක්ෂක ක්‍රමවේද අභිබවා යමින් මත් ද්‍රව්‍ය ප්‍රවාහනය කරනවා. විවිධ ස්ථාන සහ ක්‍රියාවලින්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට යොදා ගන්නා සන්නිවේදන සහ පාලක තරංග අඩපණ කිරීමට ඩ්‍රෝන යානාවල සවි කළ විවිධ පරාස තුළ තරංග නිකුත් කළ හැකි උපකරණ යොදා ගන්නවා. ඒ වගේ ම අනාරක්ෂිත ලෙස ගුවන්ගත කළ ඩ්‍රෝන යානා විවිධ පුද්ගලයන් සතුන් සහ රථ වාහන සමග ගැටීම නිසා අනතුරු සිදුවෙනවා. ගුවන්තොටුපළ ආශ්‍රිතව ඩ්‍රෝන යානා ගුවන්ගත කිරීම නිසා ගුවන්යානා පියාසර කිරීමට බාධා ඇති වූ අවස්ථාත් වාර්තා වෙනවා.

ප්‍ර - මෙවැනි නීති විරෝධී කටයුතු අපේ රටේ වාර්තා වී තිබෙනවා ද?

පි - ඔව්, අනවසරයෙන් විවිධ ස්ථාන හා කටයුතු ඡායාරූප සහ වීඩියෝගත ගත කිරීම ගැන නිතර වාර්තා වෙනවා. ඒ වගේ ම විවිධ ස්ථානවල සහ පුද්ගලයන්ගේ ගැටීම නිසා සිදුවූ හානි පිළිබඳව වාර්තා වී තිබෙනවා. හොඳම උදාහරණය මෑතක එක්තරා පුද්ගලයකු විසින් රුවන්වැලි සෑ මළුවේ සිට ගුවන්ගත කළ ඩ්‍රෝන යානයක් සෑයේ කොත් කැරැල්ලේ ගැටීම සඳහන් කළ හැකියි.

ප්‍ර - මෙවැනි නීති විරෝධී කටයුතු නතර කිරීම සඳහා වෙනත් රටවල් ගෙන ඇති ක්‍රියා මාර්ග මොනවා ද?

පි - ලෝකයේ බොහෝ රටවල් ඩ්‍රෝන අවභාවිතය අවම කරගනිමින් ඵලදායී ලෙස ඒවා භාවිතයට පියවර ගෙන තියෙනවා. විවිධ රටවල් ඔවුන්ට ආවේණික ලෙස මෙම යානා භාවිතයට අදාළ නීති රෙගුලාසි සම්පාදනය කරලා තියෙනවා. ඉහළ අහසේ ගමන් කරන අහස් යානා නිරීක්ෂණයට විවිධ තාක්ෂණික ක්‍රම යොදා ගන්නවා. නමුත් ඩ්‍රෝන යානාවල ප්‍රමාණය හා මෙහෙයුම් සීමාව තුළ එවැනි තාක්ෂණයක් යොදා ගෙන නිරීක්ෂණ කටයුතු කරන්න බෑ. මෙම යානා පහළ අහසේ පියසර කරන නිසාත් ඉතා කුඩා නිසාත් රේඩාර් වැනි තාක්ෂණ ක්‍රම යොදා ගෙන නිරීක්ෂණය කරන්න බෑ. මේ යානා නියාමනය හා අධීක්ෂණය සඳහා විශේෂිත වූ තාක්ෂණික ක්‍රම වේද යොදා ගන්නවා.

මෙම යාත්‍රාවලට අදාළ තාක්ෂණය සමග මෙම යාත්‍රාවල හැකියාවන් ඉතා වේගයෙන් දියුණු වෙනවා. එම නිසා මේවාට අදාළ නීති රෙගුලාසි වගේම අධීක්ෂණ කටයුතු සඳහා යොදා ගන්නා තාක්ෂණයත් නිරන්තරයෙන් යාවත්කාලීන වෙන්න ඕන.

නාසා (Nasa) සහ ස්ටැන්ෆර්ඩ් (Stanford) වගේ මේ ගැන පර්යේෂණ කටයුතු මෙහෙය වන ආයතන ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශන නිරන්තරයෙන්ම ප්‍රකාශයට පත් කරනවා. ඒ අනුව විවිධ රටවල් ඩ්‍රෝන යානා අධීක්ෂණයට හා පාලනයට නව තාක්ෂණය හා බැඳුණු ක්‍රමෝපායන් යොදා ගන්නවා. උදාහරණයක් විදිහට සිංගප්පූරුවේ වාණිජමය කටයුතුවල නියැළෙන ඩ්‍රෝන යානා සඳහා වෙනම ම ගමන් මාර්ග නිර්දේශ කරලා තියෙනවා. අධි ආරක්ෂිත කලාප තුළට මේවා ඇතුළුවීම වැළැක්වීමට ද විවිධ තාක්ෂණික ක්‍රම යෝජනා කරලා තියෙනවා.

ප්‍ර - ඩ්‍රෝන තාක්ෂණය විධිමත් ලෙස භාවිතයේ සහ ප්‍රවර්ධනයේ ප්‍රතිලාභ මොනවා ද?

පි - ඩ්‍රෝන තාක්ෂණය විධිමත් ලෙස භාවිතය සහ ප්‍රවර්ධනය මගින් වාසි රැසක් ලබා ගන්න පුළුවන්. ගොඩනැගිලි සහ ඉදිකිරීම්, ඉංජිනේරු, සංචාරක , ජනමාධ්‍ය හා සන්නිවේදන, භාණ්ඩ ප්‍රවාහන , කෘෂිකර්මාන්ත, සෞඛ්‍ය සේවා, වරාය හා නාවුක වැනි බොහෝ ක්ෂේත්‍රලට මේ තාක්ෂණය මගින් ප්‍රයෝජන ගන්න පුළුවන්. ඒ සඳහා බලපත්‍ර සහ ගුවන්ගත වීමේ අවසරපත් ලබාදීම මගින් රජයට දිගුකාලීන ආදායම් ලබා ගන්න පුළුවන්.

ප්‍ර - ශ්‍රී ලංකාව ඒ සඳහා ඉදිරියේ දී ගත යුතු ක්‍රියා මාර්ග මොනවා ද?

පි - මේ සඳහා අවශ්‍ය නීතිමය රෙගුලාසි බොහෝමයක් ජාතික සිවිල් ගුවන් සේවා අධිකාරිය සම්පාදනය කරලා තියෙනවා. එම නීති රෙගුලාසි බලාත්මක කිරීමට නම් ඩ්‍රෝන යානා නිරීක්ෂණය හා පාලනය කිරීමට නව තාක්ෂණය හා බැඳුණ ක්‍රමවේදයක් වුවමනා කරනවා. ඒ ඔස්සේ කිසියම් ප්‍රදේශයක ගුවන්ගත කොට ඇති ඩ්‍රෝන යානා මොනවාද ඒ යානාවල හිමිකරුවන් කවුද ඒ යානාවල ධාවන ඉතිහාසය කුමක් ද යන්න අදාළ මොහොතේ ම ආරක්ෂක අංශවලට නිරීක්ෂණය කළ හැකි විය යුතුය. රටේ පූර්ණකාලීන වශයෙන් ඩ්‍රෝන යානා තහනම් කලාප වෙත යානාවක් ආසන්න වන විට ආරක්ෂක අංශවලට මෙන් ම ඩ්‍රෝන පදවන අයට ද අනතුරු ඇඟවීමේ සංඥා නිකුත් කළ යුතුයි. කිසියම් හදිසි අවස්ථාවක ඩ්‍රෝන යානා අහසට නැංවීම නොකළ යුතු කලාප පිළිබඳ එම යානා හසුරුවන්නන් දැනුම්වත් කිරීමේ පහසුකම් ද අවශ්‍ය වෙනවා. විනෝදාස්වාදය සඳහා ඩ්‍රෝන පදවන අයට වෙනම කලාප වෙන් කිරීම අවශ්‍යයි.

මෙම යානා ලියාපදිංචිය, ගුවන්ගත කිරීමට අවසර ලබාගැනීම, ගුවන් ගතවූ යානාවල පිහිටීම හා වේගය වැනි තොරතුරු එසැණින් ලබාගැනීමට හැකියාව තිබිය යුතුයි. මේ යානා නිසා කිසියම් ජීවිත සහ දේපළ හානියක් ඇති වීමේ අවදානමක් ඇත්නම් ඒ පිළිබඳ අවධානය යොමු කර රක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුයි. ඩ්‍රෝන යානා ආනයනය කළත් මෙරට එකලස් කළත් ලියාපදිංචිය සහ රක්ෂණය අනිවාර්ය වෙන්න ඕන. සිවිල් ගුවන් සේවා අධිකාරියට විටින් විට මෙම යානාවල ප්‍රමිතිය පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් ද අවශ්‍ය වෙනවා.

ලෝකයේ ඇතැම් රටවල් ඩ්‍රෝන යානා භාවිතය නිසා මතු විය හැකි ගැටලු හඳුනා ගෙන එම යානා හැසිරවීම සහ ඒවා නිර්මාණය පිළිබඳ අධ්‍යයනය පාසල් විෂය නිර්දේශයට පවා ඇතුළත් වී තිබෙනවා. ඒ වගේම ඩ්‍රෝන යාත්‍රා හැසිරවීම පුහුණු කරන ආයතන පිහිටුවා තියෙනවා. ලංකාවෙත් ඩ්‍රෝන අවභාවිතය අවම කර ගනිමින් ඒවා ඵලදායී ලෙස භාවිත කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන වැඩසටහන් ආරම්භ කරන්න ඕන. මේ හා ගොඩ නැගෙන උප සංස්කෘතිය රටේ සංවර්ධනයට ඉවහල් වන පරිදි කළමනාකරණය කරගන්න ඕන.

සාකච්ඡා කළේ:
නාමල් උඩලමත්ත